# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2004/29 - 2017 ජනවාරි මස 30 වැනි සඳුදා - 2017.01.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3(4) වගන්තිය යටතේ වූ නිවේදනය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය මලික් සමරවික්‍රම වන මා විසින් 2016 දෙසැම්බර් 06 වැනි දින අංක 1996/26 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ නියමයන්ට අතිරේකව මෙම නියමය මගින් පහත දැක්වෙන පරිදි ප්‍රකාශ කර සිටිමි. එනම් :-

2016 දෙසැම්බර් මස 06 වැනි දින අංක 1996/26 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ සිංහල බසින් පළ කරනු ලැබූ නියමයේ (03) වැනි වගන්තිය සඳහන් ව්‍යාපෘති සමාගමේ නාමය වෙනුවට පහත සඳහන් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

''චෙක් පෝට් සිටි කලම්බු (පුද්ගලික) සමාගම''

2016 දෙසැම්බර් මස 06 වැනි දින අංක 1996/26 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ සිංහල බසින් පළ කරනු ලැබූ නියමයේ පළමු උප ලේඛනයේ (1) (i) වගන්තියේ දෙවන ඡේදය පහත සඳහන් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

''එකී බදු නිදහස් කාල සීමාව ව්‍යාපෘති සමාගම විසින් බදු අය කළ හැකි ආදායම් උපයනු ලබන වර්ෂයේ සිට හෝ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද දින සිට වසර 06 කට පසු, යන අවස්ථාවන්ගෙන් ප්‍රථමයෙන් එළඹෙන වර්ෂයෙන් ආරම්භ විය යුතු ය. මෙම අවස්ථා සඳහා 2015 මාර්තු මස 06 දින සිට ව්‍යාපෘති සමාගම, ශ්‍රී ලංකා ජනරජය සහ නාගරික සංවර්ධන අධිකාරිය ත්‍රෛපාර්ශවීය ගිවිසුම අත්සන් කළ දිනය වන 2016 අගෝස්තු මස 12 යන කාල පරිච්ඡේදය ඇතුළත් නොවිය යුතු ය.''

2016 දෙසැම්බර් මස 06 වැනි දින අංක 1996/26 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ සිංහල බසින් පළ කරනු ලැබූ නියමයේ පළමු උප ලේඛනයේ 02 වන වගන්තිය පහත සඳහන් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

> ''(2) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු (වැට් බදු) පනත
>
> ''ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ව්‍යාපෘතිය ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන සහ එම ව්‍යාපෘති ආශ්‍රිත භාණ්ඩ සහ සේවාවල දේශීය මිලදී ගැනීම් සියල්ල එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමේ අවුරුදු අටක (08) කාලය තුළ දී එකතු කළ අගය මත බදු (වැට් බදු) ගෙවීමෙන් නිදහස් විය යුතු ය. ව්‍යාපෘතිය සඳහා එම කොන්ත්‍රාත්කරු වෙත සැපයීම් කරනු ලබන යම් කොන්ත්‍රාත්කරුවකු හෝ උප කොන්ත්‍රාත්කරුවකු වැට් බදු පනත මගින් අවසර දී ඇති පරිදි බදු විලම්බනය සඳහා හිමිකම් ලබයි. ව්‍යාපෘති සමාගම විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමේ අවුරුදු අටක (08) කාලය අවසන් වූ දින සිට 2002 අංක 14 දරන වැට් බදු පනතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට වැට් බදු ගෙවීම සඳහා යටත් විය යුතු ය.''

1A - PG 3378 — 367 (2017/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කෙසේ වුවද පවතින නීතිය අනුව ව්‍යාපෘති සමාගම වෙතට බදු අයිතිවාසිකම් ලබාදීමද ව්‍යාපෘති සමාගමට ලබා දී ඇති බදු අයිතිවාසිකම් අනාගත ගැනුම්කරුවන්ට පැවරීම හා බද්දට දීම එකතු කළ අගය මත බදු ගෙවීමෙන් නිදහස් විය යුතු ය.''

2016 දෙසැම්බර් මස 06 වැනි දින අංක 1996/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සිංහල බසින් පළ කරනු ලැබූ නියමයේ පළමු උපලේඛනයේ 07 වන වගන්තිය පහත සඳහන් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''(7) ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT)

''ව්‍යාපෘති සමාගම කොන්ත්‍රාත්කරු සහ උපකොන්ත්‍රාත්කරුවන් අවුරුදු අටක (08) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව තුළ ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීමෙන් නිදහස් වන්නේ ය. තවදුරටත් පවතින නීතිය අනුව ව්‍යාපෘති සමාගම වෙතට බදු අයිතිවාසිකම් ලබා දීම ද, ව්‍යාපෘති සමාගම වෙත ලබා දී ඇති බදු අයිතිවාසිකම් යෝජිත ගැනුම්කරුවන් වෙත පැවරීම හා බද්දට දීම ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් වේ.''

2016 දෙසැම්බර් මස 06 වැනි දින අංක 1996/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ඉංග්‍රීසි බසින් පළ කරනු ලැබූ නියමයේ (03) වැනි වගන්තිය පහත සඳහන් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

''ඉහත කී ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය ''කොළඹ වරාය නගර සංවර්ධනය සඳහා මුහුදු රළ ආරක්ෂණ දියකඩනයක් ඉදි කිරීම, ඉඩම් ප්‍රතිසංස්කරණය, ගොඩබිම ප්‍රවර්ධනය, රුඳවුම් බැම්ම, මුහුදු ජලය සම්බන්ධ කිරීමේ ඇළ මාර්ග, ප්‍රධාන මාර්ග සහ උපයෝගීතා ඉදිකිරීම සහ පවතින නීතිය අනුව ඉඩම් බදු අයිතීන් අනාගත ගැණුම්කරුවන්ට පැවරීම හෝ බද්දට දීම සඳහා වශයෙන් අදියර දෙකකින් යුත් ව්‍යාපෘතිය'' වශයෙන් හැඳින්වීමට සහ දැන ගැනීමට හැකි අතර, චෙක් පෝට් සිටි කලම්බු (පුද්ගලික) සමාගම මෙම ව්‍යාපෘතිය කිරීමට භාර ගන්නා ව්‍යාපෘති සමාගම වේ.''

2016 දෙසැම්බර් මස 06 වැනි දින අංක 1996/26 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ ඉංග්‍රීසි බසින් පළ කරනු ලැබූ නියමයේ (05) වනි වගන්තිය පහත සඳහන් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''මෙම නියෝගය පළවන උපලේඛණයේ විස්තර කර ඇති ක්‍රියාතමක කිරීමෙන් නිදහස් කිරීම ව්‍යාපෘත සමාගමට අදාළ විය යුතු ය.''

2016 දෙසැම්බර් 06 වැනි දින අංක 1996/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ඉංග්‍රීසි බසින් පළ කරන ලැබූ නියමයේ පළමු උප ලේඛනයේ (1)(i) වැනි වගන්තිය පහත සඳහන් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

''(1) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත

(i) සංස්ථාපිත ආදායම් බද්ද

එකී ව්‍යාපෘතියේ කටයුතු තුළින් උපචිත වන ලාභ සහ ආදායම මත ව්‍යාපෘති සමාගම මත ආදායම් බදු පැනවීමට අදාළ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන අවුරුදු විසි පහක (25) කාලසීමාවක් සඳහා (''බදු නිදහස් කාලසීමාව'') අදාළ නොවිය යුතු ය.

එකී බදු නිදහස් කාල සීමාව ව්‍යාපෘති සමාගම විසින් බදු අය කළ හැකි ආදායම් උපයනු ලබන වර්ෂයේ සිට හෝ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද දින සිට වසර 06 කට පසු යන අවස්ථාවන්ගෙන් ප්‍රථමයෙන් එළඹෙන වර්ෂයෙන් ආරම්භ විය යුතු ය. මෙම අවස්ථා සඳහා 2015 මාර්තු 06 දින සිට ව්‍යාපෘති සමාගම ශ්‍රී ලංකා ජනරජය සහ නාගරික සංවර්ධන අධිකාරිය ත්‍රෛපාර්ශවීය ගිවිසුම අත්සන් කළ දිනය වන 2016 අගෝස්තු 12 යන කාල පරිච්ඡේදය ඇතුළත් නොවිය යුතුය.

එසේ වුවද, ඉහත කී බදු නිදහස් කාලසීමාව අවසන් වීමෙන් පසුව, ව්‍යාපෘති සමාගමේ ලාභ සහ ආදායම සම්බන්ධයෙන් වූ ආදායම් බද්ද තත්කාලයේ බලපවත්නා දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව අදාළ විය යුතු ය.''

2016 දෙසැම්බර් 06 වැනි දින අංක 1996/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ඉංග්‍රීසි බසින් පළ කරනු ලැබූ නියමයේ පළමු උපලේඛනයේ (1)(iii)(ආ) වැනි වගන්තිය පහත සඳහන් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. :-

(ආ) දළ මෙහෙයුම් ආදායමෙන් සියයට තුනක් (3%) නොඉක්මවන සම්පූර්ණ ගාස්තු ප්‍රමාණයන් සඳහා පමණක් වූ කළමනාකරණ ගාස්තු සහ රාජ්‍ය භාග ගෙවීම් සඳහා''

2016 දෙසැම්බර් 06 වැනි දින අංක 1996/26 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ ඉංග්‍රීසි බසින් පළ කරනු ලැබූ නියමයේ පළමු උපලේඛනයේ (07) වැනි වගන්තිය පහත සඳහන් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**''(7) ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) :**

ව්‍යාපෘති සමාගම කොන්ත්‍රාත්කරු සහ උපකොන්ත්‍රාත්කරුවන් අවුරුදු අටක (08) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව තුළ ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීමෙන් නිදහස් වන්නේ ය තවදුරටත් පවතින නීතිය අනුව ව්‍යාපෘති සමාගම වෙත ලබා දී ඇති බදු අයිතිවාසිකම් යෝජිත ගැනුම්කරුවන් වෙත පැවරීම හා බද්දට දීම ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් වේ.''

2016 දෙසැම්බර් 06 වැනි දින අංක 1996/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ඉංග්‍රීසි බසින් පළ කරනු ලැබූ නියමයේ පළමු උපලේඛනයේ (08) වැනි වගන්තිය පහත සඳහන් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

**"(8) ව්‍යාපෘතියට අදාළ ආනයනය කරන භාණ්ඩ මත අය කරන රේගු බද්ද**
**(රේගු ආඥාපනත - 235 වන අධිකාරිය)**

අකාර්ය ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ හැර, ව්‍යාපෘතියට නිසි පරිදි අදාළ කාලය වන අවුරුදු අටක (08) කාලය තුළ ආනයනය කරනු ලබන සියලුම ප්‍රාග්ධන ස්වභාවයේ භාණ්ඩ සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ (ව්‍යාපෘති සමාගම විසින් සෘජුවම ආනයනය කරන විට හෝ ව්‍යාපෘති සමාගමේ නාමය යටතේ කොන්ත්‍රාත්කරුවකු හෝ උපකොන්ත්‍රාත්කරුවකු මගින් ආනයනය කරන විට) රේගු බදුවලින් නිදහස් වේ. අකාර්ය ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් වන විට එකී භාණ්ඩ ශ්‍රී ලංකාව තුළ පූර්ණව නිෂ්පාදනය නොකරන අවස්ථාවක හෝ එකී භාණ්ඩ අවශ්‍ය ප්‍රමාණයෙන් හෝ අවශ්‍ය ගුණාත්මකභාවයෙන් යුක්තව ශ්‍රී ලංකාවෙන් මිලදී ගැනීමට නොහැකි වන විට හෝ ව්‍යාපෘතියේ අවශ්‍යතාවයන් අනුව නිසි කලට ශ්‍රී ලංකාවෙන් මිලදී ගැනීමට නොහැකි අවස්ථාවකදී ආනයනය කළ විට එවැනි භාණ්ඩ රේගු බද්දෙන් නිදහස් වේ.

ඒ අනුව සමස්ථයක් ලෙස, ව්‍යාපෘතිය ඉහත සඳහන් පරිදි අදාළ කාලය වන අවුරුදු අටක (08) කාලය තුළදී කොන්ත්‍රාත්කරුවකු හෝ උපකොන්ත්‍රාත්කරුවකු මගින් ආනයනය කළ හැක්කේ එම භාණ්ඩවලට අදාළව භාණ්ඩ ලබා ගන්නා ලෙස ව්‍යාපෘති සමාගම නම්කර ඇතිවිට පමණි. කිසියම් විටක ආනයනය කරන භාණ්ඩ වෙනත් ව්‍යාපෘතියකට අදාළ භාණ්ඩ සමග පොදුවේ ආනයනය කිරීමක් සිදුවුවහොත්, ව්‍යාපෘති සමාගමට දී ඇති සහන ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ සඳහා පමණක් උපයෝගී කරගත් බවට සහතික කිරීමේ පූර්ණ වගකීම ව්‍යාපෘති සමාගම සතුවන අතර එම කොන්දේසි යම් හෙයකින් කඩ කිරීමක් සිදුවුවහොත් ව්‍යාපෘතියට අදාළ නොවන සියලුම භාණ්ඩ සම්බන්ධයෙන් ගෙවිය යුතු බදු සාමාන්‍යයෙන් අදාළ වන නීති හා රෙගුලාසි වලට අනුව වහාම ගෙවීමට සිදුවේ. ව්‍යාපෘති සමාගමේ සේවකයකුගේ උපදේශකවරුයකුගේ හෝ වෙනත් අයකුගේ පුද්ගලික භාවිතය සඳහා ව්‍යාපෘති සමාගම විසින් ආනයනය කරනු ලබන පුද්ගලික බඩු බාහිරාදිය ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ ලෙස සලකනු නොලැබේ. තව ද, ව්‍යාපෘති සමාගමට 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ලබා දෙනු ලබන නිදහස් කිරීම් සහ සහන සැලකිල්ලට ගනිමින් ව්‍යාපෘති සමාගම සමග සම්බන්ධ වන යම් කුලී ගැණුම්කරුවකුට හෝ වෙනත් අයෙකුට එකී සම්බන්ධවීම හේතුවෙන් හෝ සම්බන්ධවීම කරන කොට ගෙන මෙම පනත යටතේ වෙනයම් නිදහස් කිරීමක් හෝ සහනයක් දෙනු නොලැබේ."

2016 දෙසැම්බර් මස 06 වැනි දින අංක 1996/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ඉංග්‍රීසි බසින් පළ කරනු ලැබූ නියමයේ දෙවැනි උපලේඛනයේ (1)(i) වැනි වගන්තිය පහත සඳහන් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**(1) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

**(i) සංස්ථාපිත ආදායම් බද්ද**

ආදායම් බදු පැනවීමට අදාළ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුව අවුරුදු අටක (08) කාලයක් සඳහා චයිනා හාබර් ඉංජිනියරින් කම්පැනි ලිමිටඩ් "(CHEC)" ආයතනයේ කටයුතුවලින් උපචිත වන ලාභ සහ ආදායම සඳහා අදාළ නොවිය යුතු ය. එකී අවුරුදු අටක (08) බදු නිදහස් කාලසීමාව චයිනා හාබර් ඉංජිනියරින් කම්පැනි ලිමිටඩ් ආයතනය "(CHEC)" විසින් ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමේ වර්ෂයේ සිට ආරම්භ විය යුතු ය.

කෙසේ වුව ද, මෙම කාලපරිච්ඡේදය සඳහා 2015 මාර්තු 06 දින සිට ව්‍යාපෘති සමාගම, ශ්‍රී ලංකා ජනරජය සහ නාගරික සංවර්ධන අධිකාරිය ත්‍රෛපාර්ශ්වීය ගිවිසුම අත්සන් කළ දිනය වන 2016 අගෝස්තු 12 දින දක්වා කාලපරිච්ඡේදය ඇතුළත නොවිය යුතු ය.

එසේ වුව ද, ඉහත කී අවුරුදු අටක (08) බදු නිදහස කාලසීමාව අවසන් වීමෙන් පසුව, චයිනා හාබර් ඉංජිනියරින් කම්පැනි ලිමටඩ් (CHEC) ආයතනයේ ලාභ සහ ආදායමට අදාළ ආදායම් බදු තත්කාලයේ බලපවත්නා දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව අයකරනු ලැබිය යුතු ය.

වර්ෂ 2016.12.22 වැනි දින ප්‍රසිද්ධ කරන ලද 1998/30 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මෙයින් අවලංගු කරන ලද බවට ප්‍රකාශයට පත් කරමි.

මලික් සමරවික්‍රම පා.ම.,
සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍ය.

2017 ජනවාරි මස 30 වැනි දින,
කොළඹ දී ය.

02 - 618

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.